# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1911/5 - 2015 අප්‍රේල් මස 22 වැනි බදාදා - 2015.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත**

මැතිවරණ කොට්ඨාසය - අංක 4 - මහනුවර

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයෙහි පිහිටි 1757/18 හා 2012 මැයි මස 11 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ආ" අක්ෂරය දරන ඡන්ද ප්‍රදේශයේ අංක 120 හා 121 යන ඡන්ද කොට්ඨාස නැවත බෙදා වෙන් කරන්නට යෙදුන බවත්, එසේ නැවත බෙදා වෙන් කරන ලද ඡන්ද කොට්ඨාස හා ඒ එක් එක් ඡන්ද කොට්ඨාසයට නියම කර ඇති හඳුනා ගැනීමේ අංක පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති පරිදි විය යුතු බවත්, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 4 - මහනුවර.

2015 අප්‍රේල් මස 22 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මහනුවර.

*උපලේඛනය*

ඡන්ද ප්‍රදේශය "ආ" හාරිස්පත්තුව

| *ඡන්ද කොට්ඨාසය හඳුනාගැනීමේ අංකය* | *ඡන්ද කොට්ඨාසය පිළිබඳ විස්තරය* |
|---|---|
| 120 | අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 589 දරන විලාන උඩගම ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි විලාන උඩගම ගම, හපුගොල්ල වත්ත, විලාන වත්ත සහ වොල්සන් වත්ත යන වතු ද සහ අංක 590 දරන රඹුකේ ඇළ ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි වොල්සන් ජනපදය, පන්සලතැන්න ගමද ඇතුළත් ප්‍රදේශය. |
| 121 | අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 590 දරන රඹුකේඇළ ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි රඹුකේඇළ ගම, පන්සලතැන්න නව ජනපදය සහ පන්සල තැන්න ජනපදය යන ජනපදයන් ද ඇතුළත් ප්‍රදේශය. |

05 -77


1A - G 21403 — 46 (2015/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*